ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මතය
-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

විගණනයේදී පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2010 දෙසැම්බර් 31 දින ට වෛද්‍ය මධ්‍යස්ථානයේ ඉතිරිව තිබූ රු. 538,486 ක් වටිනා බෙහෙත් තොග ශේෂ පත්‍රයේ වත්කමක් ලෙස පෙන්නුම් කර නොතිබුණි.

(ආ) 2007-2010 වර්ෂවලදී මිලදීගෙන තබූ එකතුව රු. 59,550 ක්වූ පන්දු 100 ක වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ ගිණුමේ ඇතුළත් 2008 වර්ෂයේදී මිලදී ගෙන තිබුන රු. 173,400 ක් වටිනා බහු ප්‍රක්ෂේපන යන්ත්‍රයක් 2009 වර්ෂයේදී නැතිවී තිබූ අතර එහි වටිනාකම 2010 පෙබරවාරි මස පුද්ගලික ආරක්ෂක සේවාවට ගෙවිය යුතු බිලෙන් අඩුකර ගෙවා ඇති මුත් ඒ සම්බන්ධයෙන් ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.

(ඈ) 2006,2007,2008 හා 2009 වර්ෂවලදී විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරවල පදිංචිව සිටි සිසුන්ගෙන් 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු නේවාසිකාගාර ගාස්තු රු. 597,500 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2011 පෙබරවාරි 28 දින පැවති 2010 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව තොගවල අතිරික්ත හා ඌනතා වටිනාකම් පිළිවෙලින් රු. 26,740 ක් හා 12,199 ක් ජ'නල් සටහන් මගින් නිවැරදිව තොග ගිණුමට ගලපා නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ වියදම් සඳහා කාර්ය මණ්ඩලයේ 3 දෙනෙකුට ලබාදුන් රු.36,698 ක අත්තිකාරම් 2010 දෙසැම්බර් 31 දිනට නොපියවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් පෙන්නුම් කෙරිණි.

1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිකම නිසා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් අත්පත් කර ගැනීම | 17,295,907 | හිමිකම් සහතික |
| කාර්යාල උපකරණ | 2,474,143 | වටිනාකම සනාථ කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| පරිගණක යන්ත්‍ර | 23,281,635 | |
| ක්‍රීඩා භාණ්ඩ | 1,532,828 | |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 32,590,936 | |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 1,381,220 | තැන්පත් ලේඛන/උපලේඛන |
| උපචිත වියදම් | 5,900,300 | උපයෝගී ලේඛන/විස්තරාත්මක උපලේඛන |

1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාස ආදියට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත 14(1) වගන්තිය | කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත | |
| | (i) 109 වගන්තිය | විශ්වවිද්‍යාලයේ 2009 වාර්ෂික වාර්තාව රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (ii) 110 වගන්තිය | විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| (ඈ) | 1985 අංක 01 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතින් සංශෝධිත1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වගන්තිය | 2006-2010 කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් මෙහෙයුම් සහකරුවන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් රු. 2,458,130 ක් ගෙවා නොතිබුණි. |
| (ඈ) | 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල | 2006-2010 කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් මෙහෙයුම් සහකරුවන් වෙනුවෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් රු. 368,719 ක් ගෙවා නොතිබුණි. |
| (ඉ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ නියමිත විරාම කාලයන්හිද ගබඩා සමීක්ෂණ සිදුකර නොතිබුණි. |
| (ඊ) | 1980 පෙබරවාරි 13 දිනැති අංක 63 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 6.3 වගන්තිය | ඇස්තමේන්තුගත වියදම හා ආදායම සහ තථ්‍ය සංඛ්‍යා අතර වෙනස්කම් පිළිබඳ වාර්තාවක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (උ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක යන්ත්‍ර හා උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඌ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| | (i) 1994 ඔක්තෝබර් 21 දිනැති අංක 37/94 දරන චක්‍රලේඛය | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබානොගෙන ව්‍යාපෘති මෙහෙයුම් කළමනාකරු තනතුර සඳහා වයස අවුරුදු 70 ඉක්මවූ විශ්‍රාම නිලධාරියෙකු පැවරුම් පදනම මත 2005 දෙසැම්බර් 31 දින සිට මාස 06 ක කාලයක් සඳහා බඳවාගෙන මේ දක්වා මාස තුන බැගින් ඔහුගේ සේවා කාලය දීර්ඝ කර තිබුණි. |
| | (ii) 2008 ජූලි 30 දිනැති අංක 21/2006(iv) දරන චක්‍රලේඛය | 2005, 2006 හා 2007 වර්ෂවලදී කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද මේ දක්වා විශ්ව විද්‍යාලයේ සේවය කරන මෙහෙයුම් සහකරුවන් 17 දෙනෙකුගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (එ) | මුදල් රෙගුලාසි | |
| | (i) මු.රෙ. 104 | නැතිවූ වත්කම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මු.රෙ. 110 | පාඩු හා හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |

(iii) මූ.රෙ. 756 — පුස්තකාල පොත් හා ඉතිරි බෙහෙත් තොග සම්බන්ධයෙන් වාර්ෂිකව සමීක්ෂණයක් කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතුවලින් පුනරාවර්තන වියදම සඳහා ලැබුණු රු. 152,800,000 ක්වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පසුව රු. 2,450,399 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම සඳහා ලැබුණු රු. 108,870,000 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පසුව රු. 10,441,719 ක ඌනතාවයක් විය. මේ අනුව, සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 12,892,118 ක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර, පුනරාවර්තන ප්‍රදාන, ස්වයං මූල්‍ය වැඩසටහන් ආදායම සහ අනෙකුත් ආදායම වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 අධ්‍යයන කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂය සමඟ සැසඳීමේදී 2010 වර්ෂයට ශිෂ්‍යයන් 45 දෙනෙකු එනම් 8.5% ක් අඩුවෙන් බඳවාගෙන තිබුණි.

(ආ) 2006 සිට 2010 වර්ෂය දක්වා විශ්ව විද්‍යාලයට බඳවාගත් සිසුන් 68 දෙනෙකු පාඨමාලා හැර ගොස් තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද අවසන් වසර විභාග සඳහා පෙනී සිටි සිසුන් 151 දෙනාගෙන් 148 ක් සමත් වී 03 දෙනෙක් ඌන සාමාර්ථයන් ලබා තිබුණි.

#### 2.2.2 ඒක ශිෂ්‍ය පිරිවැය

2006-2010 වර්ෂ සඳහා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව සහ මුළු පුනරාවර්තන වියදම අනුව ගණනය කරන ලද ඒක ශිෂ්‍ය පිරිවැය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු පුනරාවර්තන වියදම | ඒක ශිෂ්‍ය වියදම |
|---|---|---|---|
| | | රු. | රු. |
| 2006 | 167 | 39,282,684 | 235,226 |
| 2007 | 370 | 74,375,733 | 201,015 |
| 2008 | 741 | 118,634,901 | 160,101 |
| 2009 | 1,257 | 152,982,159 | 121,704 |
| 2010 | 1,715 | 200,874,819 | 117,128 |

පුනරාවර්තන වියදමට සාපේක්ෂව ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීමෙන් ඒක ශිෂ්‍ය පිරිවැය ක්‍රමයෙන් අඩුවී තිබුණි.

2.2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිගණක පද්ධති
---------------------

(i) විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සඳහා පරිගණක පද්ධතියක් සංවර්ධනය කිරීම වෙනුවෙන් රු. 3,680,000 ක ගිවිසුම් මුදලකට 2006 වර්ෂයේදී Gate Way Centre for Information Technology පෞද්ගලික සමාගම සමඟ ගිවිසුමකට එළඹ එම සමාගමට ගිවිසුම් මුදලෙන් 20% ක්වූ රු. 736,000 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. ගිවිසුම ප්‍රකාර පරිගණක පද්ධතිය සපයා නොතිබුන අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ රු. 368,000 ක්වූ කාර්යසාධන බැඳුම්කරයේ වලංගු කාලය 2007 පෙබරවාරි 20 දිනෙන් අවසන් වී තිබුණි. ගිවිසුම ප්‍රකාරව පරිගණක පද්ධතිය සැපයීමට කටයුතු නොකිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලයට සිදුවූ අලාභය මේ දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) සිසුන්ගේ පරිගණක අධ්‍යයන කටයුතු සඳහා කුලී පදනම මත පරිගණක යන්ත්‍ර 110 සැපයීම වෙනුවෙන් 2007 සිට 2010 දක්වාවූ වර්ෂ 04 තුළදී රු. 22,870,727 ක මුදලක් පෞද්ගලික සමාගමකට ගෙවා තිබුණි. වෙළඳ පොළේ මිල ගණන් සැලකිල්ලට ගැනීමේදී ඉකුත් වර්ෂවලදී පරිගණක යන්ත්‍ර කුලියට ගැනීම සඳහා ගෙවූ මුදලෙන් නව මාදිලියේ පරිගණක යන්ත්‍ර 280 ක් මිළදී ගැනීමට විශ්ව විද්‍යාලයට හැකියාව තිබුණ බව නිරීක්ෂණය විය.

(ආ) නේවාසික පහසුකම්
-----------------------

(i) විශ්ව විද්‍යාලය විසින් කාර්ය මණ්ඩලයේ 59 දෙනෙකුට නේවාසික පහසුකම් සැපයීම සඳහා මාසිකව කුලී ගෙවීම් පදනම මත නිවාස 38 ක් බද්දට ගෙන තිබූ අතර ඒ වෙනුවෙන් 2010 වර්ෂය සඳහා නිවාස අයිතිකරුවන්ට කුලී වශයෙන් රු. 3,654,496 ක් ගෙවා තිබුණි. නමුත් නේවාසික කාර්ය මණ්ඩලයෙන් නිවාස කුලී හා ගාස්තු වශයෙන් අයකර ගෙන තිබුණේ රු. 521,762 ක මුදලක් පමණි. ඒ අනුව නේවාසික නිවාසවලට කුලී ගෙවීම සඳහා විශ්ව විද්‍යාලයට වාර්ෂිකව රු.3,132,734 ක පමණ අමතර වියදමක් දැරීමට සිදුවී තිබුණි.

(ii) විශ්වවිද්‍යාලය විසින් තනිකඩ නිවාස සඳහා බදුකුලී ගෙවීමට අමතරව මාසික විදුලි හා ජල බිල්පත් ද ගෙවා තිබුන නමුත් එම නිවාසවල නේවාසිකව සිටින කාර්ය මණ්ඩලයෙන් කිසිම කුලියක් හෝ ගාස්තුවක් අයකර ගෙන නොතිබුණි.

2.2.4 වත්කම් කළමනාකරණය
----------------------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවශ්‍යතාවය නොසලකා 2006, 2007 හා 2009 වර්ෂ සඳහා ශිෂ්‍ය අත්පොත් මුද්‍රණය කිරීමේ හේතුවෙන් පිරිවැය රු. 172,825 ක්වූ ශිෂ්‍ය අත්පොත් 557 ක් ඉතිරිවී තිබුණි.

(ආ) 2010 ජූනි 29 දිනැති අභ්‍යන්තර විගණන වාර්තාව අනුව රු. 76,422 ක් වටිනා පුස්තකාල පොත් 145 ක් අස්ථානගත වී තිබුණි.

(ඇ) වෛද්‍ය මධ්‍යස්ථානයේ වර්ග 29 කට අයත් බෙහෙත් තොග කල් ඉකුත් වී තිබුණි.

(ඇ) අවශ්‍යතාවයට වඩා මිළදී ගෙන තිබූ ඇඳන් 76 ක් හා මෙට්ට 198 ක් 2010 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ සහ බ්ලොක් F ගොඩනැගිල්ලේ ගබඩාකර තිබුණි.

(ඉ) 2010 ජුනි 30 දින මිළදී ගෙන තිබූ රු. 322,560 ක් වටිනා ගිනි ආරක්ෂක සේප්පු 05 ක් 2011 මැයි 31 දින වනවිටත් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ තිබුණි.

2.2.5 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේ සිට 2011 අගෝස්තු 04 දින දක්වා විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මහාචාර්ය තනතුරු 07 ක් හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය තනතුරු 03 ක් සඳහා බඳවා ගැනීම් කර නොතිබුණි. 2010 දෙසැම්බර් 31 දිනට අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 129 න් 32 ක් පුරප්පාඩුව පැවතිණි.

(ආ) අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 82 න් 58 ක් පුරප්පාඩුව පැවතණි.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය නොමැතිව 2006 නොවැම්බර් මාසයේ සිට 2011 අගෝස්තු 04 දින දක්වා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ වැඩබලන පාඨමාලා අධ්‍යක්ෂ ලෙස නිලධාරියෙකු බඳවාගෙන රු.378,000 ක දීමනාවක් සමඟ රු.154,419 ක ප්‍රවාහන දීමනාවක් සමාලෝචිත වර්ෂය තුළ දින 37 ක් සේවය කිරීම වෙනුවෙන් ගෙවා තිබුණි.

2.2.6 අයවැය පාලනය

-------------------

අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන තිබුණු බවක් දක්නට නොලැබුණි.

3. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය

(ඇ) ස්ථාවර වත්කම්

(ඇ) ගබඩා